## මධ්‍යම පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික - අර්ධ ශිල්පීය සේවා ගණයෙහි (PL 2- 2006 A) සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය - සංශෝධන අංක 02

| ඡේද අංකය | දැනට තිබෙන පෙළ | ඡේද අංකය | යෝජිත සංශෝධනය | සංශෝධනයට හේතු |
|---|---|---|---|---|
| ඇමුණුම් අංක 04 | තනතුර<br><br>1. ජලනල කාර්මික<br>2. බංගලා භාරකරු<br>3. වඩු කාර්මික<br>4. වැද්දුම්කරු<br>5. පෙදරේරු<br><br>තනතුර<br><br>1. අරක්කැමි<br>2. මැහුම් සේවිකා<br>3. රසායනාගාර ශිල්පී<br>4. උපස්ථායක / උපස්ථායිකා<br>5. දුරකථන ක්‍රියාකරු<br><br><u>වෘත්තීය සුදුසුකම්</u><br><br>තනතුරට අදාළව තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය 2 හෝ 3 මට්ටමක (NVQ 2 හෝ NVQ 3) ලබා තිබීම. | ඇමුණුම් අංක 04 | තනතුර<br><br>1. ජලනල කාර්මික<br>2. බංගලා භාරකරු<br>3. වඩු කාර්මික<br>4. වැද්දුම්කරු<br>5. පෙදරේරු<br><br>තනතුර<br><br>1. අරක්කැමි<br>2. මැහුම් සේවිකා<br>3. රසායනාගාර ශිල්පී<br>4. උපස්ථායක / උපස්ථායිකා<br>5. දුරකථන ක්‍රියාකරු<br><br><u>වෘත්තීය සුදුසුකම්</u>: අදාළ නොවේ | මධ්‍යම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂගේ අංක සීපීසී/පීඩීඑච්එස්/පී01/01/2016 හා 2016.02.02, මධ්‍යම පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක සීපීසී/එච්එම්/එච්අර්/11/13-19 හා 2016.02.09, ප්‍රධාන ලේකම්ගේ අංක සීපීසී/සීඑස්/2/3/එස්එම්/එච්(III) හා 2016.02.26 දිනැති ලිපි මගින්, සීමිත බඳවා ගැනීමට අදාළ වන සුදුසුකම් යටතේ අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්වල වෘත්තීය සුදුසුකම් යටතේ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය 2 හෝ 3 මට්ටමක (NVQ 2 හෝ NVQ 3) ලබා තිබීම ඉවත් කිරීම, පහත හේතූන් මත සීමිත බඳවා ගැනීම් යටතේ වෘත්තීය සුදුසුකම් සැපිරීම අදාළ නොවන බව දන්වා ඇත.<br><br>I. සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ ශිල්පීය නොවන තනතුරුවලට බඳවා ගනු ලබන්නේ රෝහල් ඇතුළු වෛද්‍ය ආයතන තුළ අවම වශයෙන් වසර 05 ක් තුළ ක්ෂේත්‍රය තුළ අත්දැකීම් ලබා ගනිමින් විශේෂඥ වෛද්‍යවරු, වෛද්‍යවරු හා අනෙකුත් තාක්ෂණික නිලධාරීන්ගේ සෘජු අධීක්ෂණයට යටත්ව සේවය කරන ලද සේවක සේවිකාවන්ය.<br><br>II. එසේම උපස්ථායකයින් බඳවා ගැනීමේදී ඉහත සේවක සේවිකාවන් තවත් මාස 03 ක විධිමත් සිද්ධාන්තික ප්‍රායෝගික පුහුණුවකට යටත් කර ජාතික මට්ටමේ ලිඛිත, වාචික හා ප්‍රායෝගික පරීක්ෂණයකින් පසු උපස්ථායක පත්වීම් සඳහා තෝරාගනු ලැබේ.<br><br>එසේ හෙයින් ඉහත සඳහන් කරුණු (I) හා (II) සැලකීමේදී ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය 2 හෝ 3 (NVQ 2 හෝ NVQ 3) ලබා තිබීම අවශ්‍ය නොවේ. |

| | | | | |
|---|---|---|---|---|
| | | | | රේඛීය සෞඛ්‍ය අමාත්‍යාංශයට අදාළ ප්‍රාථමික - අර්ධ ශිල්පීය සේවා ගණය (PL 2- 2006 A) සඳහා වන අනුමත බඳවා ගැනීමේ පරිපාටියේ සීමිත බඳවා ගැනීම සඳහා වන සුදුසුකම් යටතේ වෘත්තීය සුදුසුකම් අදාළ නොවන බව සඳහන් කර ඇති බැවින්, මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2014.01.22 දිනැතිව අනුමත කරන ලද පරිපාටියේ ඇමුණුම් අංක 04 හි වෘත්තීය සුදුසුකම් යටතේ පහත වගන්තිය ඉවත් කිරීම.<br>"තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය 2 හෝ 3 මට්ටමක (NVQ 2 හෝ NVQ 3) ලබා තිබීම" |

2016.05.03 දිනැති කොමිෂන් සභාවේ නිර්දේශය

| නම | | අත්සන |
|---|---|---|
| 01. ගාමිණී දසනායක මහතා | (සභාපති) | .................... |
| 02. යූ.ඒ. බෝගහපිටිය මහතා | (සාමාජික) | .................... |
| 03. ජී.ජී.එස්.ඒ. දිසානායක මහත්මිය | (සාමාජික) | .................... |
| 04. වී. නන්දකුමාර් මහතා | (සාමාජික) | .................... |
| 05. ඒ.ජේ.එම්.එම්. නිස්තාර් මහතා | (සාමාජික) | .................... |

මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය

අනුමත කරමි / නොකරමි

....................................

නිලූකා රත්නායක
මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර
2016.05.10